# නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

# නාගරික සංවර්ධන අධිකාරිය

# ඇබෑර්තු

පහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා යථාපරිදි සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් හා පළපුරුද්ද සතු අය විය යුතුය.

## අධ්‍යක්ෂ (මූල්‍ය) - (තනතුරු 01)

**සුදුසුකම්**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, ගිණුම්කරණ / වානිජ්‍ය / ව්‍යාපාර පරිපාලන / කළමනාකරණ හෝ වෙනත් ඕනෑම අදාළ ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක්.

සමග

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් (මාස්ටර්ස්) හෝ තනතුරෙහි විෂය ක්ෂේත්‍රයට අදාළ, පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආයතනික සාමාජිකත්වය.

සහ

ප්‍රථම උපාධිය ලබාගත් පසුව, "කළමනාකරණ තලයේ", රජයේ සේවයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක, අවම වසර 15 ක පළපුරුද්ද.

අයදුම්කරුගේ වයස, අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය** : ජ්‍යෙෂ්ඨ කළමනාකරු තලය (HM - 1-2)

**මාසික වැටුප** : රුපියල් [81,670 - 15X2,270 - 115,720/-]

## අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් සඳහා සහකාර ලේකම් - (තනතුරු 01)

**සුදුසුකම් :**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විෂය ක්ෂේත්‍රයට අදාළව වානිජ්‍ය / නීති (LLB) හෝ වෙනත් ඕනෑම උපාධියක්

සහ

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පනතක් මගින් ස්ථාපිත ශ්‍රී ලංකා වරලත් ලේකම්කරණ ආයතනයේ ආයතනික සාමාජිකත්වය.

සහ

අදාළ ප්‍රථම උපාධිය ලබාගත් පසුව, තනතුරට අදාළ ක්ෂේත්‍රයේ, රාජ්‍ය සේවයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක අවම වසර එකක (01) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

අයදුම්කරුවන් වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය** : මධ්‍යම කළමනාකරු තලය (MM - 1-1)

**මාසික වැටුප** : රුපියල් [53,175 - 10X1,375 - 15X1,910 - 95,575/-]

02) පොදු කොන්දේසි :

- අ) සඳහන් ඉහළ වයස් සීමාව රාජ්‍ය සේවයේ / සංස්ථාවල අයදුම්කරුවන්හට අදාළ නොවේ.
- ආ) පත් කිරීම් ස්ථිර පදනමින් සිදුකෙරේ.
- ඇ) සේවක අර්ථසාධක අරමුදල (අධිකාරිය මගින් 15% දායකත්වයක් ලබා දේ.)
- ඈ) සේවක භාර අරමුදල (අධිකාරිය විසින් 3% දායකත්වයක් ලබාදේ.)

03) ආන්තික ප්‍රතිලාභ :

- අ) UDA නිවාස ණය හා ආපදා ණය යෝජනා ක්‍රමය
- ආ) වාර්ෂික ප්‍රසාද දීමනා
- ඇ) ලබානොගත් වෛද්‍ය නිවාඩු සඳහා මුදල් ප්‍රතිපූරණය
- ඈ) වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය

04) තෝරාගත් අයදුම්කරුවන්, ඔවුන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද මත මූලික වැටුප් පරිමාණයේ ඉහළ වැටුප් තලයක තැබීම සඳහා සලකා බලනු ලැබේ.

05) අයදුම්කරුවන් විසින්, සම්පූර්ණ ජීවදත්ත, අධ්‍යාපනික, වෘත්තීය හා පළපුරුද්ද සම්බන්ධ විස්තර සමග ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් සහිතව වූ අයදුම්පත්, ලියාපදිංචි තැපෑලෙන්, පහත සඳහන් ලිපිනය වෙත, මෙම දැන්වීම පළවී දින 14 ක් ඇතුළත එවිය යුතුය. අදාළ අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

06) රාජ්‍ය සේවයේ ආයතනවල සේවය කරන අයදුම්කරුවන්, තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතු අතර, අදාළ නියමිත වේලාවට අයදුම්පත් ලැබීම සහතික කරනු සඳහා ඍජු පිටපතක් යොමු කරන ලෙසට උපදෙස් දෙනු ලැබේ.

කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලබයි.

**සභාපති,**
**නාගරික සංවර්ධන අධිකාරිය,**
**07 වන මහල, "සෙත්සිරිපාය", බත්තරමුල්ල.**